ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 නොවැම්බර් 05 සඳුදා
05 වෙළුම - 03 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



# ළමා ප්‍රදීපය



ඡායා : තිසර

# මේ මළවුන්ගේ මාසයයි

## පුංචි අපිත් මළවුන්ගේ මාසය අරුත්බරව ගත කරමු !

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# මළවුන් සිහි කරන "නොවැම්බරය" අරුත්බර කරමු.

## ආදරණීය දුවේ පුතේ...

අපි දැන් පා තබා තිබෙන්නේ නොවැම්බර් මාසයටයි. මේ මාසය නම් කරන විටම කතෝලික අපට සිහිපත් කරවන්නේ ''මළවුන්ගේ මාසය'' පිළිබඳවයි. නොවැම්බර් මළවුන් සිහිපත් කරන මාසය බව කතෝලික ජන වන්දනාවේ අවශ්‍යයෙන්ම සඳහන් වී තිබෙනවා. මේ මාසය විශ්වාස යේ අත්දැකීමටත් බෙහෙවින්ම ලං කරමින් නිර්වචනය කරනව නම් අපට කෙටියෙන්ම මෙලෙස පැවසිය හැකිය. මරණය මරමින් එය පරාජය කර උත්ථානයේ විජයග්‍රහණය ලත් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සකල ජනතාවට හිමිකර දුන් උත්තරීතර ගැලවීම සමරමින් මළාවු අපගේ සියලු ඥාතිමිත්‍රාදීන් සිහි කරමින් ඔවුනට සග ලොව නිත්‍යවූ සන්තර්පනය ප්‍රාර්ථනා කරමින්ද , දිව්‍ය පූජා පවත්වමින් , ආත්මයන්හි සහනය පතා දන ධර්මවල යෙදෙන මාසය නොවැම්බර් මාසයයි.

ආදර දුවේ පුතේ,

ඔබේ පවුලෙත් කිනම් හෝ ඥාතියෙක් මිය ගිය බව දැනවෙන අත්දැකීමක් අනිවාර්යන්ම ඔබට තිබෙනවා. ඔබට ඉතාම සමීප ඥාතියෙකු මිය ගිය විට දැනෙන ශෝකය , තනිකම හා පාළුව කෙතරම් ද කියන එක අලුතින් කිව යුතු නැහැ. දෙමව්පියන් අහිමි දූ දරුවන් තමන්ගේ ජීවිතයේ මොන තරම් අසරණ බවක්, පාළුවක් අත් දකිනවා ද? දූ දරුවන් අහිමි වූ දෙමව්පියන් කෙතරම් ශෝක බරිතව සුසුම් හෙලමින් ජීවිතය ශෝකාලාපයක් කරගෙන තිබෙනවාද? මිනිස් ජීවිතය තුළ ඒ වියෝවීම අතිශයින්ම දුක්බරිතයි. දරා ගැනීමට හරිම අපහසුයි. සොහොන් ගැබ මත ඇවිලෙන ඉටිපන්දම් දැල්ලත් , ඒ අද්දර සිටුවා තිබෙන කුරුසියේ සංකේතයත් අපට නිහඬව පවසන්නේ එක්තරා ශෝකී කථා පුවතක්.

නමුත් ක්‍රිස්තියානි විශ්වාසිකයින් හැටියට එය සම්පූර්ණයෙන්ම අවසානයද? මනු උපතේ අවසානය සියල්ලෙහි සමාප්තියද? එය එසේ නොවන බව මේ නොවැම්බරයේ සිතිවිලි අපට පසක් කර දෙනවා. මේ නොවැම්බරය තුළ දෙව්මැදුරු වල පිදෙන දිව්‍ය පූජා එමටයි. ජීවත්ව සිටින බොහෝ දෙනෙක් මිය පරලොව ගිය සිය දෙමව්පියන් , දූ දරුවන් , ඥාතීන් සිහිපත් කරලා දිව්‍ය පූජා පුද කරන්නට සම්මාදන් වන්නේ ක්‍රිස්තුන් වහන්සේ තුළ ඒ ආත්මයන් ලැබිය යුතු නිත්‍ය සන්තර්පණයට ගැඹුරු අර්ථයක් ලබා දෙන්නටයි.

එම නිසා ආදර දුවේ පුතේ, මේ මාසය තුළදී දිව්‍ය පූජාව තුළ නිරන්තරයෙන්ම උච්චාරණය වන ප්‍රශංසා ගීතයේ වචන දෙසට ඔබේ මෙනෙහි කිරීම් යොමු කළ යුතුමයි. ඒ වචන දිව යන්නේ මේ අයුරෙනුයි. ''ඔබ වහන්සේගේ අභිප්‍රායෙන් අපි ඉපදෙමු . ඔබ වහන්සේගේ අණසක යටතේ අපි ජීවත් වෙමු. ඔබවහන්සේගේ නියමයෙන් මරණයට ගොදුරු වී දූවිල්ලට නැවත හැරී පාපයේ රැහැනින් මිදී යමු''

නව උපතක උදවක් පිළිබඳව සිතිවිලි විශ්වාසිකයින් අතර නිබඳව ජනිත කරනවා. මනු උපත වගේම සග උපතත් කිතුනු අපට උරුමයි. මනු උපත ලබන සෑම විශ්වාසිකයෙක්ම ජීවිතය නිර්මාණය කර ගනු ලබන්නේ මැවුම්කරුවාණන්ගේ සැලැස්ම අනුවයි. ඔවුන් වහන්සේ අපට පවරන කර්තව්‍යය නිමාව දක්වා ගෙන යාම මනු උපත ලබන අපගේ වගකීමයි. මැවුම් කරුවාණන්ගේ ඒ සැලැස්ම මනු දිවිය තුළ සමාප්තිය කරා අප ගෙන යනු ලබන මොහොත කොතැනද ඒ මොහොතේ පටන් මනු උපත හමාර කොට අප සග උපතට උරුම කම් කිව යුතුය. එම නිසා ආදර දුවේ පුතේ, ජීවිතය අයිති දෙවියන් වහන්සේටයි. එහි සැබෑ පරම රක්ම ඇත්තේත් ඔවුන් වහන්සේ අතයි. එබැවින් ජීවිතය නසන්නට අයිතියක් අපට නැහැ. ජීවිතය නැති කරන්නට අයිතියක් අපට නැහැ.

නමුත් අවාසනාවකට අද අප ජීවත් වන පරිසරයන්, සමාජයන් තුළ ජීවිතය නැති කර ගන්නට පෙරට එන අයව අපට හමු වෙනවා. ජීවිතය නැති කරන්නට උත්සහ කරන අයව අපට හමුවෙනවා. සමූල ඝාතන කරන්න කැස කවන අයව අපට හමු වෙනවා. ඒ පමණක් නොවෙයි. සදකාලික අමරණීයත්වය තමන්ට පමණක් උරුමයි යන හැඟීමෙන් ජීවත් වන අයත් අපට හමුවෙනවා. ඒ හැම කෙනෙක්ම ජීවිත අරමුණ ජීවිත පැවැත්ම හා ජීවිත උරුමය පිළිබඳ අවබෝධ කර ගත යුතු ධර්මතා අමතක කළ උදවිය.

නමුත් කිතුනුවා ඒ තැනට පත් විය යුතු නැහැ. ජීවිතය වගේම මරණයෙන් අපට උත්පාද කරන්නේ දැහැමියාවේ සිතිවිලියි. ඒ සිතිවිලි තුළ අපේ ජීවිත උරුමය හා සැලැස්ම අපි දෙවියන් වහන්සේට භාර දිය යුතුමයි. අන්න එවිට ඔවුන්වහන්සේ අපේ ජීවිත කථාන්දරය ඔවුන් වහන්සේගේ සැලැස්ම අනුව ලස්සනට ලියාවි. ඒ කථාන්දරය කවද හෝ සොහොන් ගැබේ සනිටුහන් වෙත්දි සොහොන් ගැබත් නොවැම්බරත් ජීවත් ව සිටින අයට මොන තරම් පණිවිඩයක් ගෙන එනවද?

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**


# "ළමා විය" නමැති "රසගුලාවේ" මිහිරි අසිරිය !

කතෝලික පවුලක දුවක හෝ පුතකු වශයෙන් උපත ලැබ, දෙමාපිය සොයුරු සොයුරියන්ගේ ඇසුරේ දිවි ගෙවන්නට ''වාසනා මහිමය'' ලැබූ ඔබ හරිම වාසන වන්ත යි. ඔබ ළමා වියට පිළිපන් ද සිට ලැබූ අත්දැකීම් ඔස්සේ ජේසු සමිඳුණන්ගේ ආශිර්වාදය බොහෝ අවස්ථාවල නොඅඩුව ලැබුවාට කිසිම සැකයක් නෑ.

ළමා විය තරම් සුන්දරවූත්, අසිරිමත් වූත්. අවධියක් තවත් නැති තරම්. ඔබ වැඩිහිටියකු වූ දක , රස කර කර පවසන ළමා වියේ අත් දැකීම් තරම් මිහිරි දෙයක් තවත් නැති තරම්. ඔබේ නිවස , පාසල සහ දහම් පාසල යන ත්‍රිත්වය ඇසුරෙන් ලබන අත්දැකීම් මේ අතර ප්‍රධාන වෙනවා.

මේ අවධියේ ලබන රසබර අත්දැකීම් කාටත් ලෙහෙසියෙන් අමතක වන්නේ නෑ. ඔබ ඔබේ පවුලේ දෙමාපිය, සොයුරු, සොයුරියන් ඇසුරේත්, පාසල තුළ ගුරුවරුන් හා මිතුරු ඇසුරේත් , දහම් පාසල තුළ පූජක , පැවිදි, ගුරුවරුන් ඇසුරේත් විවිධ අත්දැකීම් ලබන බව රහසක් නොවේ.

සොයුරු - සොයුරින් අතරත් පාසල හා දහම් පාසලේ මිතුරු - මිතුරියන් අතරත් මිතුරු දම් වැඩීමත්, කැඩීමත්, යළි මිතුරු දම් සවි වීමත් කොතරම් මිහිරි දැයි දැනටමත් ඔබට වැටහී ගොස් ඇතැයි සිතනවා. ඔබේ ළමා විය ජීවිතයේ විවිධ තෝරා ගැනීම සඳහා ද පාදක වෙනවා. කතෝලික දරුවකු හැටියට දේව කැඳවීමක් වෙසෙස් අයුරින් ලබා ගැනීමට අවස්ථාව උද වන්නේ ද ළමා අවධියේ දීයි. එවැන්නක ඉඟියක් ඔබට දැනී ඇත්නම් දෙමාපියන්ට සහ මීසමේ පියතුමා ට දැනුම් දීමට ඔබට හැකියාව තිබෙනවා.



**ඔබේ ළමා විය ජීවිතයේ විවිධ තෝරා ගැනීම සඳහා ද පාදක වෙනවා. කතෝලික දරුවකු හැටියට දේව කැඳවීමක් වෙසෙස් අයුරින් ලබා ගැනීමට අවස්ථාව උදවන්නේ ද ළමා අවධියේ දීයි. එවැන්නක ඉඟියක් ඔබට දැනී ඇත්නම් දෙමාපියන්ට සහ මීසමේ පියතුමා ට දැනුම් දීමට ඔබට හැකියාව තිබෙනවා.**

ආදර දුවේ, ආදර පුතේ, ඔබේ සුන්දර ළමා විය තුළදී නැණ නුවණින් වර්ධනය වී, අධ්‍යාපනය ගැන වැඩි නැඹුරුවක් ඇතිව සතුට , ප්‍රීතිය, කරුණාව , සමාව දීම වැනි ගුණාංග වර්ධනය කර ගැනීමෙන් ඔබේ ළමාවිය ලස්සන කර ගන්න හිතට ගන්න. එවිට දුවේ ! පුතේ ! ඔබට ජය නියතයි! ළමා වියේ අසිරිය නොඅඩුව විඳ දරා ගැනීමට, ඔබ හැමට ජේසු සමිඳු වරම් ලැබේවා ! **ඩික්සන් ඇන්ටනි (මාමා)**

## ශිෂ්‍ය නායක වැඩමුළුවක් !

තඹරවිල කනිටු විද්‍යාලීය සිසු නායක නායිකාවන් හට ශිෂ්‍ය නායක වැඩමුළුවක් 2012 නොවැම්බර් 10 වන දින වයික්කාල දිව්‍ය සංරක්ෂණ දියණිය කන්‍යාරාම ශාලාවේදී පැවැත් වීමට කටයුතු යොදා ඇත. පෙ.ව. 8.30 සිට ප.ව. 2-30 දක්වා පැවැත්වෙන මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක දේශක, කුමර නයනජිත් මහතා විසිනි.

හලාවත පදවි කතෝලික පාසල් අධ්‍යාපන සහය අධ්‍යක්ෂ ගරු ධනුෂ්ක ප්‍රනාන්දු පියතුමන්ගේ අනුශාසකත්වයෙන් තඹරවිල කනිටු විදුහලේ විදුහල්පති ෂෙල්ටන් ප්‍රනාන්දු මහතා ඇතුලු ආචාර්ය මඩුල්ල මෙය සංවිධානය කරනු ලබයි. ( **ශිෂ්‍ය නායක සංගමය** )

## වසරක් සැමරීම

**නොදැනම වසරක් ගියා ලොකු තාත්තේ**
**ඔබ මට කියා දුන්න දේ මට මතකයි ලොකු තාත්තේ**
**ඔබ නැතුව මට පාළුයි දැන් ලොකු තාත්තේ**
**මම සිතමි ඔබ ජේසු ළඟ ඇති කියලා ලොකු තාත්තේ**

**ඔබ වැවූ මල් දැන් සුන්දරයි ලොකු තාත්තේ**
**ඔබේ රෝස මල් පාත්තිය දැක මා සතුටු වූණා ලොකු තාත්තේ**
**ඔබ සිටිනා කාලය තුළදුන් හැම දේටම ස්තූති ලොකු තාත්තේ**
**ඔබට මා සැම දා ණයගැති ලොකු තාත්තේ**

**මම ඔබේ සිනා මුහුණ දැක මා සතුටු වූණා ලොකු තාත්තේ**
**ඔබ ලියා දුන් දේ මා ඉගන ගත්තා ලොකු තාත්තේ**
**ඔබේ ජීවිතය ඉතා සුන්දරයි ලොකු තාත්තේ**
**ජේසු පිහිටයි ආදරණීය ලොකු තාත්තේ**

**ප්‍රවීන් හෙට්ටිආරච්චි**
04 ශ්‍රේණිය - සා. ජෝශප් විදුහල
මීගමුව ශාඛාව

# ධර්මදූත සේවාව හා ධර්මදූත සේවය




**දෙවියන් වහන්සේගෙන් ඇසු දෙවන ප්‍රශ්නය මෙයයි. ''ආදර ජේසුනී මගේ පැවදි දිවිය පුරාවට මා භාරගත් ධර්මදූත සේවාවන් ඉතාමත් සාර්ථකව කළත් මගේ ඇතුලාන්තය හිස් බවක් දැනෙන්නේ ඇයි? අසතුටින් , සිටින්නේ ඇයි?**



නැවත වරක් පියතුමා සමග පුද්ගලික මෙනෙහි කිරීම්වල යෙදිනි. එක් දිනක් පියතුමා මගෙන් මෙසේ ඇසීය. ''සිස්ටර් , ධර්මදූත සේවාව හා ධර්මදූත සේවය කියන්නේ ,එකක්ද? දෙකක්ද? මා සරලව එයට දුන් පිළිතුර මෙයයි. ''එකක්'' යනුවෙනි. එවිට පියතුමා මෙසේ පැවසීය. ඔබත් පැවදි දිවියේ වරද්දගෙන තියෙන තැනත් ඔතැනමයි. ඔබගේ වැඩ කොටස සාර්ථකව කර අසතුටුවීමට හෝ සෑහීමකට පත් නොවීම ට හේතුවත් එයමයි. බොහෝ අය අවබෝධ කරගෙන නැති දෙයත් එයමයි.

> **දේව ප්‍රේමය, සහෝදර දයාව, පරිත්‍යාගය , කරුණාව , නිහතමානිකම වැනි දේව ගුණාංග නැති ධර්මදූත සේවාව ලුණු රසය නැති ලුනු හා සමාන බව අවබෝධ කර ගතිමි.**


ධර්මදූත සේවාවන්ද දී ඇත්තේ ධර්මදූත සේවය හෙවත් දේව ප්‍රේමය ප්‍රකාශ කරන්නයි. දේව ප්‍රේමය, සහෝදර දයාව , පරිත්‍යාගය , කරුණාව , නිහතමානිකම වැනි දේව ගුණාංග නැති ධර්මදූත සේවාව ලුණු රසය නැති ලුනු හා සමාන බව අවබෝධ කර ගතිමි. කිතුනු අයගෙන් විශේෂයෙන් පූජක හා පැවිදි සැමගෙන් ස්වාමීන් වහන්සේ බලාපොරොත්තු වන්නේ දේව රාජ්‍යයේ වටිනාකම් ගොඩනගන ධර්මදූත සේවාවක් මිස ලෞකික වටිනාකම් ගොඩනගන සිවිල් සේවාවක් නොවන බව ද අවබෝධ කර ගතිමි.

පියතුමා තුළින් දෙවිඳුණෝ මාගේ දෙවන ප්‍රශ්නයට පිළිතුරු දුන් බැවින් ඥාණකාන්තිය නවතා මා නැවත මඩමට ගොස් මගේ ශ්‍රේෂ්ඨ පැවදි සොයුරියන්ට සියල්ල විස්තර කළෙමි. පසුව මට මගේ පැවදි දිවිය අර්ථවත්ව ගත කරන්නට හැකි විය.

ආදර දුවේ පුතේ, ඔබ කරන වැඩවල අර්ථයක් නැති බව දැනෙන විට මොහොතක් නිශ්ශබ්දව සිට ජේසු සමග කථා කරන්න. ඔබ අර්ථවත් නැති දෙයක් කරනවා නම් ඔබව ඉන් මුදවා ගන්නා අතර ඔබ අර්ථවත් දෙයක් කරනවා නම් ඔබට උන්වහන්සේ මග පෙන්වන සේක. එ වගේම ඔබ කරන හැම වැඩකින්ම ජේසුගේ ආදරය ප්‍රකාශ විය යුතුයි. පිරිසිදු චේතනාවෙන් වැඩ කළ යුතුයි.

**ගරු ශිරෝමා ප්‍රනාන්දු පැවිදි සොයුරිය**

## යවනු මැනවි මා දිව්‍ය වෙදැදුරාණෙනී....



ඔබ මා තෝරාගත්තේ  
කුමටදැයි නොදනිමි සමිඳේ  
බිඳුණු සිත් නොව රෝගී වූ  
ගත වෙත  
සුවයක් දෙන්නට  
යවනු මැනවි මා.....  
දිව්‍ය වෙදැදුරාණෙනී  
අන්ධ වූ සැමගේ ඇස්  
පාදන්නට  
කොරවූ පා යළි ඔබ වෙත  
ගෙනෙනට  
දිව්‍ය ඔසුව දිව්‍ය සුවය  
මනු දනට බෙදන්නට  
වෙදැදුරකු ලෙස ඔබගේ සේවෙට  
යවනු මැනවි මා දිව්‍ය වෙදැදුරාණෙනී.

**චතුරාණී පෙරේරා**  
**11 ශ්‍රේණිය**  
**ශා. මරියා දහම් පාසල - උස්වැටකෙයියාව**

# මූලධර්මවාදීන්ට මුලා නොවී විශ්වාසයෙන් ජීවත් වෙමු

**එදා ජේසුස් වහන්සේ පැවසුවා ''මාගේ පර්වතය මත මේ සභාව ගොඩ නගන්න, මරණයෙ බලයට වුවද එය පරාජය කළ නොහැකිය'' කියලා අද ඔබ අප සතුටු විය යුතු කරුණක් නම් එදා ජේසුස් වහන්සේ කියූ මේ අමරණීය වදන සිදුවෙලා තිබෙන බවත් වර්තමානය තුළ සිදුවෙමින් තිබෙන බවත් ය.**

මක්නිසාදයත් මුල් කිතුනු සභාව තුළ තිබුණු අරගල, තර්ජන, වැරදි මත විශ්වාස , බෙදුම් ආදි අභියෝග ජයගෙන ජේසුස් වහන්-සේ එදා පේදුරු තුමාට කියූ මේ වදන තුළ ගැබ්වී තියෙනවා. අදත් ඒ වගේමයි. අප මුල් කිතුනු සභාව දෙස බැලුවොත් රෝම අධිරාජ්‍ය වාදින්ගෙන් නීරෝ අග්‍රාජයාගෙ සිට දියොක්ලෙසියානු අග්‍රාජයාතෙක් කෙතරම් පීඩා තිබුණද?

පේදුරු තුමා පාවුළු තුමා ආදී අපෝස්තුළුවරු නොබියව විශ්වාසය නිසා ප්‍රාණ පරිත්‍යාග කළාද? ඒ වගේම වැරදි ඉගැන්වීම් නොසිටික් වාදය, ඩොනාට්‍රස් , වැනිකි යන වාද කොච්චර හැල හැප්පීම් ද? නොස්ටික් වාදින්ගේ සුපුවත ගත්තොත් පහත දැක්වෙන කථා ඇතුළත් වී තියෙනවා.

ජේසුස් වහන්සේ කුඩා කල මැටියෙන් කුරුල්ලන් සාදා පණදුන් බවත් , මිතුරන් සමග සෙල්ලම් කරමින් සිටියදී ජේසුස් වහන්සේගේ හිතරිදු අය මරණයට පත් කළ බවත්ය. අද ලෝකයේ කතෝලික සභාව දෙස බැලුවොත් ලෝකයේ වැඩිම ජනගහනයක් අදහන්ගේ ශු. සභා මාතාවගේ දරුවන්ය. ඒ අනුව බිලියන 2.18 කි මුල් කිතුනු සභාව වගේම අදත් අපට විශාල අභියෝග තිබෙනවා. යෙහෝවා වහන්සේගේ සාක්ෂිකරුවෝ වාගේ අන්තවාදි බයිබල් සභා අද ලෝකය තුළ 30000 අධිකයි.

කතෝලික සභාවට පමණක් නොව අන්‍ය අගමිකයන්ටත් මෙය විශාල තර්ජනයක් වී හමාරය. මොවුන් නිවෙස් වලට පැමිණ බයිබලයෙ වගන්තියක් තෝරාගෙන අපගෙන් ප්‍රශ්න කරයි. තර්ක කරයි. ශුද්ධෝත්තම පියතුමා ප්‍රකාශ කර ඇති මේ විශ්වාසයේ වසර තුළ අන් සභා වල වැරදි මත විශ්වාසයන් වලට මුලා නොවී, එකම පවුලක් ලෙස එකට එකතු වී, සභාවේ ඉදිරි වැඩ කටයුතු වලට සහය වෙමින් කැපවෙමින් ජිවිතය වුවත් පූජා කිරීමට අධිෂ්ඨාන කර ගමු.

**එමිල් දෙනෙතිව ජෝසප්**
**09 ශ්‍රේණිය**
**සාන්ත ජෝසප් විදුහල - ග්‍රෑන්ඩ්පාස් , කොළඹ 14**

# මගේ ආදර අම්මේ

දස මසක් කුසේ දරා මෙලොවට මා බිහිකළේ
ලේ කිරි කර පොවලා මා ඇති දැඩි කළ
මගේ ආදර අම්මේ රෑ අහසට පුන් සඳ මෙනි
ඔබ මගෙ දිවියට සඳා සෙවනැල්ලට වඩා ළඟින්
මා ලඟ සිටියේ සැමදා ඔබනේ අම්මේ......
පාසල් කටයුතුවලදී ඉහළින් ජයගෙන සාර්ථකත්වයේ
යතුර ඔබ යැයි පිළිගෙන දෙවිඳුන් වෙත
පුදනා ඒ පහන් වැටිය ගෙන ඔබ වෙත
තැබුවට නැත පව් සිදුවන්නේ මට
දුක සැප දෙකෙහිම සිටිමින් මා සැනසූ
ඔබ කරදරයක් වූ විට මා අත්නොහැරී ඔබ
තීරණයක් ගන්නා විට මග පෙන්වූ
ඔබ මා දිරිගන්වමින් දුවේ කියා කිව්වේ
ඔබයි මගේ ආදර අම්මේ

**අජන්දනා නිම්නාදි රොද්‍රිගෝ**
**11 ශ්‍රේණිය**
**කන්‍යාමරිය රාජේශ්වරියගේ දහම් පාසල - රන්පොකුණගම**



**මාසික සිතිවිල්ල**
"ඔක්තෝබර් මාසය"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**මාසික සිතිවිල්ල**

**ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ**

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## යාච්ඤාව පිළිබඳ සභා ඉගැන්වීම

★ ඉරුදින දිව්‍ය පූජා යාගයේදී භාවිත වන විශ්වාසකයින්ගේ යැදුම් කවර ආකාරයේ යැදුම් විය යුතුද?

• විශ්වාසකයින්ගේ යාච්ඤා සංඛ්‍යාව පහකට සීමා වන්නේ නම් මැනවි. ඒවා පූජා නීති සංග්‍රහයේ අංක 46 හි දක්වා ඇති ස්වරූපයට හැකිතාක් අනුකූල විය යුතුය. අපට භාවිත කළ හැකි ආදර්ශයක් මෙහි පහත දැක්වේ.

- සභා ශ්‍රේෂ්ඨයන්, පූජක , පැවිදි හා දේව සේවකයින් උදෙසා.
- ලෝකයේ ගැලවීම, ශුද්ධවන්තභාවය සහ ජනතා නායකයින් , දේශය උදෙසා
- ලෝ තුළ අසරණ , පීඩිත ජනතාවගේ අවශ්‍යතාවයන් උදෙසා,
- මීසම් සංඝය උදෙසා (මෙහෙයට සහභාගිවන්නන් උදෙසා)
- එකිනෙකාගේ පෞද්ගලික අවශ්‍යතාවයන් උදෙසා.

ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.

**පූජා නීති අංක 46.**

විශ්වාසකයින්ගේ යැදුම් සඳහා අදහස් මෙලෙස පිළියෙල කළ යුතුයි.

1. සාන්ත සභාවේ විවිධ අවශ්‍යතාවයන් උදෙසා
2. ලෝකයේ ගැලවීම සහ ජන නායකයින් උදෙසා
3. විවිධාකාර අවශ්‍යතාවයන්ගෙන් පෙළෙන පීඩිත අය උදෙසා
4. මීසමේ සැදැහැවත් ජනතාව උදෙසා

මේ හැර අභිවෘද්ධි ආලේපය, ආශිර්වාදකාර බන්ධනය, අවමංගල්‍ය පිළිවෙත් ආදී විශේෂ අවස්ථාවන්හීදී ඒවාට ගැලපෙන අයුරින් සකස් කර ගත හැකි වෙයි.

★ පොදු වන්දනාව හෙවත් සාමුහික යාච්ඤාව සභාව නිල වශයෙන් කෙරෙන විට එය හඳුන්වන්නේ කුමන නමකින්ද? • ජනවන්දනාව

★ කතෝලික ධර්මයේ ප්‍රධාන සත්‍යතා අඩංගු වී ඇති විශ්වාස ලක්ෂණයේ අප විශ්වාස කළ යුතු සත්‍යතා කීයක් තිබේද? • 12 යි

## යාච්ඤාව සහ ශුද්ධවන්ත ජීවිතය

★''ස්වාමිනි , මා ඔබගේ සාමයේ අවියක් කළ මැනව'' මෙය කවුරුන් ගේ යැදුමක්ද?

• අසීසියේ ප්‍රැන්සිස් මුනිතුමා

★ අසීසියේ ප්‍රැන්සිස් තුමාගෙ ''සාමයේ යාච්ඤාවෙන් '' ඔබට ඉගෙන ගත හැකි විශේෂ ගුණාංග හතරක් ලියන්න.

- අප එකිනෙකා සාමයේ අවියක් වීම වෙනුවෙන් යාච්ඤා කිරීම
- අසමගියේ තුවාලයන්ට ශාන්තිය ලබා දීමට වරම් හා යාච්ඤා කිරීම
- අවිශ්වාසයෙන් යුතු තැනට විශ්වාසය පතා යාච්ඤා කිරීම
- ශෝකය වටලාගත් තැනට ප්‍රීතිය පතා යාච්ඤා කිරීම
- අඳුරින් වැසී ගිය තැනට ආලෝකය ගෙන යාමට වරම් පතා යැදුම

ඉතිරිය ලබන සතියේ .....

# අපි දෙවියන් වහන්සේව විශ්වාස කරමු...




ආදර දුවේ පුතේ,

මම කැමතියි මෙද මම දෙවිඳුන් අත්දුටු අවස්ථා අතරින් ඉතා ප්‍රබල අවස්ථාවක් ඔබත් සමග බෙදා ගන්න. මීට මාස තුනකට පමණ පෙර ''වත්මන් ගුරු භූමිකාවේ අභියෝග'' යන කෘතිය දෙරට වැඩීමේ උළෙල සඳහා ආරාධනා පත් බෙදා දීම සඳහා මම කොළඹ පසල් කීපයකට ගියා. එම කටයුත්ත අවසන් කර පෙ.ව. 11.00 ට පාසලට පැමිණි මම සුපුරුදු පරිදි පාසලේ වැඩ අවසන් කර නිවස බලා පිටත් වුනා. ඒ යන අතරවාරයේ මගේ ඇස් දෙකේ අපහසුතාවයක් දැනුනා. ඇසේ අපහසුතාවයක් දැනුනත් එදින සවස පැවැත්වූ දිළිඳු ධීවර දරුවන්ට ඉගැන්වීමේ කටයුතු සඳහා යාමට මා තීරණය කළා. මා ඉගැන්වීමේ කටයුතු සිදුකරන අතරවාරයේ කුඩා දරුවන් කීප දෙනෙක් මදක් බිය වී මගේ ඇස් රතු වී ඇති බවත් සුදුපාට දියරයක් ඇස් වලින් ගලා යන බවත් ඒ නිසා ප්‍රතිකාර ලබා ගන්නා ලෙස ඉල්ලීමක් කළා. මේ නිසා මා සවස 4.45 ට පමණ තීරණය කළා සීදුව රජයේ රෝහල වෙත යන්න.



මා රෝහල වෙත යන විට බාහිර රෝගී අංශයේ වෛද්‍යවරු රාජකාරි අවසන් කර පිටව ගොස් තිබිනි. එහෙත් ආරක්ෂක අංශයේ නිළධාරී මහත්වරු සඳහන් කරනු ලැබුවේ රෝහල් වාට්ටුවකට ගියහොත් ප්‍රතිකාර ලබා ගත හැකි බවය. අනතුරුව රෝහල් වාට්ටුවට යන විට අදළ වෛද්‍යතුමා රාජකාරි නිම කර පිටව සිටි නමුත් නැවත සේවයට වාර්තා කිරීමට නියමිතව තිබුනේ රාත්‍රී 8.00ටය. එහෙත් මගේ ඇස් දෙක දෙස මදක් වේලා බලා සිටි හෙදි සොහොයුරිය වහාම වෛද්‍යතුමාට මේ පිළිබඳ දැනුම් දීමට පියවර ගන්නා ලදි. අනතුරුව වෛද්‍යතුමා පැමිණ ඉතාම හොඳින් ඇස් පරීක්ෂා කර ප්‍රතිකාරද නියම කර මා හට සඳහන් කළේ මගේ ඇසට විෂ බීජයක් ගොස් ඇති බවත් මෙහි ඇති අපහසුතාවයට උණ ද වැළඳිය හැකි බවත්ය. මා දින ගණනාවක් විවේක ගත යුතු බවද නිර්දේශ කරන්නට විය. එපමණක් නොව. මාසයකින් පැමිණ විශේෂ ප්‍රතිකාර ක්‍රමයක්ද ලබා ගත යුතු බව සඳහන් කළා.

එහෙත් එම ප්‍රතිකාර ක්‍රමයට මා මදක් බිය වීමි. කෙසේ නමුත් මා සීදුව හංදියට පැමිණ පසුදින පාසල් යාමට තදබල සිතක් පහල වූයෙන් ඇස ආවරණය කර ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය සියල්ල මිළදී ගත්තෙමි. එහෙත් පසුද අවදි වූ විට මගේ ඇසේ අපහසුතාවය මුළුමනින්ම ඉවත් වී තිබිනි. රෝගී වූ ඇස සුවපත් වී තිබුනි. මා ඇස් ආවරණ සියල්ල ඉවතලා සුපුරුදු පරිදි පාසලට පැමිණ සුපුරුදු පරිදි වැඩ ඇරඹුවෙමි.

එහෙත් දින දෙකකට පසු විශේෂඥ වෛද්‍ය තුමා මුණ ගැසුනෙමි. එතුමා සඳහන් කළේ මගේ ඇසේ තත්ත්වය යහපත් වන බවය.

ආදර දුවේ පුතේ, අපි දෙවියන්ව විශ්වාස කරනවා නම් දේව ගරු බිය ඇතිව දෙවි වදන තුළ ජීවත් වනවා නම් දෙවියන් වහන්සේ අපව ආරක්ෂා කරනවා. අපේ ජීවිතයේ අපි මුහුණ දෙන සැම ප්‍රශ්නයකදීම, කරදරයකදීම , අභියෝගයකදීම සාර්ථකව මුහුණ දෙන්න අපට ශක්තිය ධෛර්ය මඟ පෙන්වීම ලබා දෙනවා. ඒ නිසා දුවේ , පුතේ, ඔබත් ජීවිතයේ සැම කටයුත්තක දීම දෙවිඳුන්ට මූලිකත්වය දී කටයුතු කරන්න. ජීවිතයේ කවදාවත්ම වරදින්නේ නෑ.

ජී .ඒ නිමාලි ප්‍රනාන්දු
ගුරු මව

## කලමුල්ල සිඟිති ළමුන්ගේ ඉංග්‍රීසි දිනය



කලමුල්ල මීසමේ කුඩාමල කන්‍යාරාමයේ ළඳරු පාසලේ වාර්ෂික ''ඉංග්‍රීසි දිනය'' ළඳරු පාසල් පාලිකා ගරු ශානිකා පැවිදි සොහොයුරියගේ හා ආචාර්ය මණ්ඩලයේ මෙහෙයවීමෙන් පසුගියද ළඳරු පාසල් රංග ශාලාවේදී කලමුල්ල මීසම් සේවක ගරු මොරිස් නාමල් පියතුමාගේ හා කටුකුරුන්ද කන්‍යාරාමයේ ගරු ත්‍යාගා ප්‍රධාන පැවිදි සොහොයුරියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.මෙදින අවස්ථාවක් සේයා රුවෙහි දිස්වේ.

**සටහන - ඇන්ටනි ප්‍රනාන්දු , සේයා - ස්ටුඩියෝ රනිල්**



## ලොව කිතුනු කලා අසිරිය

# මළවුන්ගේ මංගල්‍යයෙන් ඇරඹි

**මළවුන්ගේ මංගල්‍යය යෙදුනු නොවැම්බර් 02 ද පටන් නොවැ
ඥාති හිතමිත්‍රාදීන් සිහිකිරීම කතෝලික චාරිත්‍රයකි. මර
ගන්නා තෙක් ඇතැම් විට ශුද්ධගිනිස්ථානයේ දැවෙන්නට සිදුව
ඔවුන්ගේ ආත්මයනට පින් පිණිස පුන්‍ය ක්‍රිය**

**මේ සියලු ක්‍රියා දමයන් විවිධ සිත්තරුන් සිය ෙ
මෙවර කිතුනු කලා අසිරියෙන් ඔබ වෙතට ගෙ**



හඬා වැටෙන කතගේ සොහොන
- සී බෙනට් -



ශුද්ධගිනිස්ථානයේ ආත්මයන්ගේ
රැජිනිය වූ අප ස්වාමි දු



සිස්ටයින්
- මයි

# ඕ මළවුන්ගේ මාසය

**ැම්බර් මාසය පුරා මියගිය සිය දෙමාපිය ණයෙන් මතු සදකාල ජීවිතය ලබා න බැව් අදහන කතෝලික විශ්වාසිකයෝ ාවන් හි  නිරත වෙති.**

**ළිතුඩට හසුකරගත් ආකාරය ත එන්නට දැරූ වැයමකි මේ**




මරණයෙන් ඔබ්බට
- රූබන්ස් -



දෙව්මැදුරේ සිව්ලිමේ
කල් ඇන්ජලෝ -

මළවුන්ගේ දිනය
(1859)





අලඩාර් කොරොස් හි ක්‍රිච්
(හන්ගේරියාවේ බුඩාපේස්ට් ජාතික කලාගාරයේ )

මළවුන් වෙත දයාවෙන්
(1910)
- විලියම් බෞගරිවු -



ශිරාන් මෛත්‍රී



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 76

## Prepositions and Places
## නිපාත පද සහ ස්ථාන

Prepositions ගැන කලින් පාඩම් වලදී අපි ඉගෙනගත්ත වුනත් නිතර දෙවේලේ අපිට භාවිතා කිරීමට සිදුවන සමහර Prepositions භාවිතය ගැන බොහෝ දෙනකුට වරදින්නට ඉඩ තියෙනවා. ඒ නිසා අපි නිතර අපට භාවිතා වන Prepositons වෙත තව දුරටත් අවධානය යොමු කරමු.

බොහෝ විට අපිට යම් යම් ස්ථාන පිළිබඳව ප්‍රකාශ කිරීමේදී ගැටළු ඇතිවෙනවා.

අපි අද යම් යම් ස්ථාන වලට අදාළව Prepositions යෙදෙන හැටි බලමු. ස්ථාන වලට (භූගෝලීය පිහිටීම් වලට අනුව) යම් යම් Prepositions යෙදීමේදී මේ රීති ටික මතක තියාගන්න.

1. මහද්වීප (Continents) සඳහා යොදන්නේ **in**
   නිදසුන් - In Asia, In Europe

2. රටවල් සඳහා යොදන්නෙ **in**
   නිදසුන් - In Srilanka, In China, In Germany

3. නගර (Towns, Cities) දිස්ත්‍රික්ක (District), පළාත් (Provinces), ගම් සහ පෙදෙස් villages and areas යනාදිය සඳහා යොදන්නෙ **in.**
   නිදසුන් - in Colombo,
   In the Gampaha district
   In the Sabaragamuwa Province
   In Pamunugama

4. දූපත් හෝ දූපත් සමූහයක් සඳහා යෙදෙන්නේ **in** (Islands and groups of Islands) He lives in the Philipines.
   Fish is very cheap **in** these islands.

5. කඳු (තනි කඳු) සඳහා යෙදෙන්නෙ On.

   නිදසුන් - **On** mount Everest
   **On** the Top of the mountain
   **On** Piduruthalagala

   ඒත් කඳුවැටි සඳහා යෙදෙන්නේ **in**
   In the Himalayas

There are so many medicinal herbs **in** the Knuckles.
(දෙයා(ර්) ආ(ර්) සෝ මෙනි මෙඩිසිනල් හර්බ්ස් ඉන් ද නකල්ස්)
නකල්ස් කඳු වැටියේ බොහෝ බෙහෙත් පැලෑටි වර්ග තිබේ.

6. ගංගා සහ වැව් (rivers and lakes) සඳහා: වතුර මතුපිට ගැන කතා කරද්දී යොදන්නෙ On වතුර යට ගැන කතා කරද්දී යොදන්නෙ **In**

   නිදසුන් - He wanted to swim **in** the lake
   (හී වෝන්ටඩ් ටු ස්විම් ඉන් ද ලේක්)
   වැවේ පීනන්න ඔහුට ඕන වුණා.

   There was a boat **on** the lake
   (දෙයා(ර්) වෝස් අ බෝට් ඔන් ද ලේක්)
   වැවේ බෝට්ටුවක් තිබුණා.

7. සමුද්‍ර සහ මුහුදු (Oceans and Seas) සඳහා යෙදෙන්නෙ **in.**

   නිදසුන් - **In** the Pacific Ocean

   There were many storms in the Indian ocean in the recent past. The fishermen are not allowed to fish in the Negombo sea.
   මීගමු මුහුදේ මාළු ඇල්ලීමට අවසර නැහැ.

   Bathing has become dangerous in the Prithipura sea now.
   බේදිං හැස් බිකම් ඩේන්ජරස් ඉන් ද ප්‍රීතිපුර සී නව්.

8. වෙනස් පුද්ගලයින්ට වෙනස් ස්ථාන පිළිබඳව කතා කරද්දී යොදන්නෙ at.

   නිදසුන් - I was **at** home yesterday.
   (අයි වෝස් ඇට් හෝම් යිස්ටඩේ)
   මං ඊයෙ ගෙදර හිටියා.

   He is **at** university now.
   (හී ඉස් ඇට් යුනිව(ර්)සිටි නව්)
   එයා දැන් විශ්ව විද්‍යාලයේ (ඉගෙනුම ලබනවා)

## බදුල්ල පදවිය



බදුල්ල ශා. මරියා ආසන දෙව්මැදුරේදී සිංහල දමිළ දූ දරුවන් 40 ක් ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගත්හ. මීසම් පති ගරු ප්‍රියලාල් කුරේ පියතුමා , ගරු ශීරානි ප්‍රනාන්දු පැවදි සොයුරිය සහ ගරු රොබට් ජේකබ් පියතුමා සහ දහම් ගුරුවරීයන් සමග දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූ ළමුන් සේයාරුවකට පෙනී සිටි අයුරු. **ශ්‍රීකාන්ති ගුණවර්ධන**




## කොළඹ පදවිය



මිරිගම ජපමාල දේව මාතා දේවස්ථානයේ ළමෝ 22 ක් පසුගියදා පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. දිව බොදුන් ලැබීමෙන් පසු මීරිගම මීසම් සේවක ගරු අනුර ශ්‍රී කමල් , මිරිගම මීසම් පුතකුවන කුරුණෑගල පදවියේ ගරු චන්දන හපුආරච්චි යන පියතුමන්ලා දහම් ගුරුවරුන් සහ මීසම් ධර්ම සේවා සභාවේ ගරු ලේකම් මහතා සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු. **වයලට් සෝමලතා**

දෙහියාගාත මීසමට අයත් දඹදුරය සාන්ත සෙබස්තියන් මුනිදුන්ගේ දහම් පාසලේ ළමෝ සය දෙනෙකු පසුගියද ප්‍රථමවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. දෙහියාගාත මීසම් සේවක ගරු හිෂාන්ත පෙරේරා පියතුමාගේ අනුශාසකත්වයෙන් දෙහියාගාත මීසම් සහයක ගරු ටෙරන්ස් ප්‍රසංග පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු විය. දිව බොදුන් ලැබූ ළමුන් සහයක පියතුමා හා ගුරු මෑණිවරුන් සමග සේයාරුවකට පෙනී සිටි අයුරු මෙහි දිස්වේ.



**අසුන්තා ප්‍රනාන්දු**



කටුවපිටිය සා. සෙබස්තියන් දෙව් මැදුරේ දරුවන් 44 දෙනෙකු ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ.

මීසම් සේවක ගරු ශ්‍රීකාන්ත ප්‍රනාන්දු සහයක මිසම් සේවක ගරු ඩිල්රන් පීරිස් යන පියතුමන්ලා හා දහම් පාසල් සිංහල හා ඉංග්‍රීසි අංශයන් හි විදුහල්පතිතුමියන් හා ගරු මැඩ්ලින් පැවදි සොහොයුරියද සමග ළමා ප්‍රදීපය කැමරාවට මුහුණ දුන් අයුරු

**ඇග්නස් සියඹලාපිටිය.**



## දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

**නිකේෂා ඩිෂ්මි**
05 ශ්‍රේණිය
දංකොටුව බාලිකා මහ විදුහල

### පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.




## මුහුදු වෙරළ

**නෙත්මි සුදේශිකා**
01 ශ්‍රේණිය,
සුරදුතික බාලිකා අපේක්ෂාවේ
පාසල - පයාගල



## නරක පුරුද්දක්

**කෙවින් කෲස්**
05 ශ්‍රේණිය
ශාන්ත ජෝශප් විදුහල
කඩොල් කැලේ - මීගමුව



## දෙවි පියා මැවූ ලෝකය

**බ්‍රයන් ශමාල් ෆැර්නැන්ඩස්**
05 ශ්‍රේණිය
ක්‍රිස්තුරාජ ජාතික පාසල - තුඩැල්ල ,
ජා-ඇල




## ක්‍රිස්තුරජාණන් වහන්සේ

**බර්නාඩ් සුදර්ශන්**
07 ශ්‍රේණිය
ගා/අනුරුද්ධගම කනිටු විදුහල



## මගේ පවුල

**මෙතුලි විහංගි ප්‍රනාන්දු**
01 ශ්‍රේණිය
ආවේ මරියා බාලිකා විදුහල - මීගමුව



## දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

**අවිශ්කා ඉවංජි ප්‍රනාන්දු**
06 ශ්‍රේණිය
සිරිහඳ දෙව් මැදුර
රාජගිරිය



## අපේ උපන් දිනය


**සන්දුෂ කුලතුංග**
02 ශ්‍රේණිය,
සාන්ත ලෝරන්ස්
කන්‍යාරාමය
කොළඹ 06

# ශු. ගර්ට්‍රෘඩ් මුනිවරිය



අසේල දසනායක විසිනි

ජර්මනියේ සැක්සනි නම් ප්‍රදේශයේ ක්‍රි.ව. 1256 දී උපත ලබන මෙතුමියගේ දෙමාපියන් හෝ ඥාතීන් පිළිබඳව කිසිදු තොරතුරක් හමුනොවේ. එහෙත් මෙතුමිය හැඩ ගැසෙන්නේ හා හැදී වැඩෙන්නේ අනාථ දරු වකු මෙනි. වයස අවු 5 දී හෙලප්ටා නගරයේ පිහිටා තිබූ බෙනදිකාන තාපසිකාරාමයට ඇතුළු වන ඇය එහි ශ්‍රේෂ්ඨ මව්තුමිය යටතේ සහ එතුමිය සොයුරිය වූ මෙක්ටිල් නම් ගුරුතුමිය යටතේ අධ්‍යාපනය හා පුහුණුව ලබා ගන්නීය. මෙලෙස තාපසිකාරාමයේ දී සියල්ල මනාලෙස පුරුදු වන ඇය ඉගෙනීමට හා බාහිර කටයුතු උදෙසා ද ඉතා ඥානවන්ත ලෙස ඥානයෙන් හා දැහැමි බවෙන් වැඩිවර්ධනය වූවාය. ඉගෙනීමට මනා දක්ෂතාවක් දැක්වූ ඕතුමිය සාහිත්‍යයට හා දර්ශනවාදයට ඉමහත් ලැදියාවක් දැක්වූ අතර, දාර්ශනික දේවධර්මයට හා ඇයට අනාවරණය වූ සිදුවීම් තුළින් අනාවරණය වූ දේවධාර්මික දර්ශනයන් හා ප්‍රකාශන වලින් ද භාවනාවෙන් ද ලේඛන ඉදිරිපත් කළ අතර ශු. ලියවිල්ල පෙරටුකොට ගෙන ශු. සභා පිතෘවරුන්ගේ ද ග්‍රන්ථ අධ්‍යයනයෙහි නිරත වූවාය.



සුදුවර චරිතයක් හඳුනාගනිමු


තවද එකල තාපසාරාම තුළ හා තාපසිකාරාම තුළ ශු ලියවිල්ල හා සභා ලේඛන පිටපත් කරගෙන ඒවා එක් එක් භාෂාවලට පරිවර්තනය කළාය.

දිනක් ඕතුමිය කන්‍යාරාමයේ දී යදින විට ජේසු සමිඳුන්ගේ මෝක්ෂ යෙහි අභිරහස්‍යමය පූජාවක් ඔප්පු කරනු දුටුවාය. එදින දේවමාතාවන් පරලොවට වැඩිය මංගල්‍යය දිනය වුයෙන්, දේවමාතාවන් ප්‍රමුඛ ශුද්ධවන්තයෝ දෙවිඳුන් හට පසස ගැයුම් නගන හඬ ඈ දුටුවාය. ඇය ද මොහොතකින් ඊට හවුල් වූවාය. ඒ වසරේ දී ශු. ජුවාම් තුමාගේ මංගල්‍යය දින ජුවාම් තුමා ඇයව ජේසු සමිඳුන්ගේ ළය මත හිඳුවනු දුටුවාය. මෙලෙස ගර්ට්‍රෘඩ් තුමිය දෙවි පියාණන් වහන්සේ මිනිස් අපට ඇති දයාබර ප්‍රේමයේ සලකුණක් වන දිව්‍ය හෘදයේ භක්තියේ ප්‍රථම අපෝස්තුළුවරියද දිවැසිවරිය ද වුවාය.

ගර්ට්‍රෘඩ්තුමියගේ ශු. ලියවිලි ඉතාමත් ස්වල්ප ප්‍රමාණයක් අපට ලැබී ඇත. දේව ප්‍රේමය ප්‍රකාශ කරන්නා යන ග්‍රන්තයෙහි ඇගේ ම ජීවිත කථාව ස්වාමින් වහන්සේගේ අනාවරණ යෙන් ඈ රචිත බව සඳහන් වේ. ඇගේම තාපස සොයුරිගේ භාවිතයට ''ආත්මික අභ්‍යාස '' යන පොත ඈ විසින් සම්පාදනය කළ අතර එහි ස්වාමින් වහන්සේගේ දුක්විඳීමේ වටිනාකම ගැන මෙසේ සඳහන් කරයි. ''ඔබ ප්‍රීති සන්තෝෂයෙන් සතුටුවන විට, ඔප්පුකරන මිහිරි භක්ති අභ්‍යාසයන්ට වඩා ඔබ දුක්වේදනා මධ්‍යයේ සමිඳුන් හට ඔප්පුකරන යහපත් අදහස් වලින් උන්වහන්සේ ප්‍රීතිප්‍රමෝද වන අතර වෙනස්කිරිමට බැරි අපහසු දෙයක් ඉවසිලිමත් කම දරන්නාට මහිමලත් විපාක ලැබෙන්නේය'' යනුවෙනි.

වයස අවු 46 දී එනම් ක්‍රි.ව. 1302 නොවැම්බර් 16 වන දින ස්වර්ගස්ත වන අතර ක්‍රි.ව. 1677 දී II වන ක්ලෙමන්ට් ශු. පියතුමා විසින් මෙතුමියව ශුද්ධවරයට ඔසවන ලදි. සංචාරකයන්ගේ ආරක්ෂක මුනිවරිය ලෙස සැලකෙන මෙතුමිය, දකුණු ඉන්දීය කොදෙව් දූපත් වල හා නාපෝලි නගරයේ ආරක්ෂක මුනිවරිය හා නාම සාන්තුවරිය ලෙස නම් කර ඇත.

# ප්‍රහේලිකා අංක




34

සැකසුම

තිළිණි දුතිකා පෙරේරා

හරහට

1. මෝසෙස්ගේ මරණයෙන් පසු ඊශ්‍රායෙල් ජනතාවගේ නායකයා වශයෙන් පත්වූයේ මොහුය.

3. ක්‍රිස්තුන් වහන්සෙ, මනස්ථාපනය නොවූ නගරවල වැසියන්ට කථා කරමින් ''දේව විනිශ්චය දවසේදී ඔබට වඩා .................... හා සිදොනයට සහනය ලැබෙන්නේ යැයි'' වදාළ සේක මෙහි හිස්තැනට සුදුසු වචනය

4. ක්‍රිස්තුස් වහන්සේ බොහෝ අවස්ථාවල මෙය කඩ කළ බවට විනධරයන් හා පරිසිවරු ක්‍රිස්තුන් වහන්සේට චෝදනා කළෝය

5. ''මගේ වියගහ කරට ගෙන මගෙන් ඉගෙන ගන්න'' එවිට ඔබට ............ ලැබෙනු ඇති'යි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

7. දොළොස් වසරක් මහලේ රෝගයෙන් පෙළුනු ස්ත්‍රීයක් ක්‍රිස්තුන් වහන්සේගෙන් සුවය ලබාගත්තේ මහත් විශ්වාසයකින් යුතුව මෙය ස්පර්ශ කිරීමෙනි.

පහළට

1. දේව මැණියන්ගේ පියාගේ නම

2. ''මගේ පියාණන් වහන්සේගේ නිවාසයෙහි බොහෝ .......... ඇතැයි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ශු. බයිබලයේ නව ගිවිසුමෙහි ශු. පාවුළු තුමා විසින් යවනු ලැබූ හසුන් පත්වලින් එකකි.

5. තමන්ට විරුද්ධව පව් කරන සහෝදරයාට කමා විය යුත්තේ මෙම වාර ගණන දක්වා පමණ දැයි පේදුරු තුමා ක්‍රිස්තුන් වහන්සේගෙන් ප්‍රශ්න කළේය.

6. යක්ෂයා , ක්‍රිස්තුන් වහන්සේව පරීක්ෂා කරමින් ලෝනයේ සියල් රට රාජ්‍යයන් පෙන්වා මේවා කෙරෙහි මුළු ආදිපත්‍යයද ඒවායේ........ ඉසුරුද ලබා ගැනීමට නම් යක්ෂයාට නමස්කාර කරන ලෙස ඉල්ලීය. මෙහි හිස්තැනට සුදුසු වචනය

(මෙම ප්‍රහේලිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. මතෙව් 11/18, ශු. ලූක් 4,8,9,6 , ශු. ජුවාම් 14,)




## බටගම ශු. අන්තෝනි දහම් පාසල



බටගම ශු. අන්තෝනි දහම් පාසලේ ගුරු මඬුල්ල හා දහම් පාසලේ සියලුම ළමුන්ගේ සහභාගිත්වයෙන් පසුගියද පොළක් පැවැත්වුණි. මීසම් සේවක ගරු බර්නාඩ් නිශාන් විලත්ගමුව පියතුමාගේ මගපෙන්වීම යටතේ ගරු. සහෝදරතුමන්ගේ හා ප්‍රධාන පැවදි සොහොයුරියන්ගේ හා දෙමාපිය , වැඩිහිටි සැමගේ සහයෝගය මෙයට ලැබිණි.

**රොනාලි බෙත්තිලියෝන්.**

## දියලගොඩ සාන්ත බෙර්නාදෙත් ළදරු පාසල



දියලගොඩ සාන්ත බෙර්නාදෙත් ළදරු පාසලේ වාර්ෂික පොළ පසුගියද එම පාසල් භූමියේදී දියලගොඩ මීසම් සේවක, ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. ගරු පියතුමන් විසින් පීත්ත පටිය කපා මෙය විවෘත කරන අයුරු මෙහි දිස්වේ. පෙර පාසලේ විදුහල්පතිනිය, ගරු මේරී රීටා පැවදි සොහොයුරියගේ මූලිකත්වයෙන් දෙමාපියන් හා ගුරුවරියන්ගේ සහයෝගයෙන් මෙය සංවිධානය කරන ලදී.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**


රන් කුමාරයයි කිඳුරු කුමාරියයි
කතාව:-
දෙබස, චිත්‍ර:-
21
හ්ම්... දැන් එහෙනං කුමාරිගෙ හිත වෙනස් වෙලා ඇති ..හොඳයි..
රැජිණගෙන් පස්සෙ රජකම භාර ගන්න ඉන්නෙදු කුමාරි හින්ද රැජිණ කුමාරිට පණ වගේ ආදරෙයි.. දැන් ඉතිං කුමාරිගෙ හිත වෙනස් වෙලා ඇති..... කියල හිතලා...
මේ දෙන්නට නිදහස් කළා..
මගෙ දූ කුමාරියි.. මන්තුකාරිගෙ දුවවයි වහා නිදහස් කර හරිනු..
නිදහස ලැබුන රජ කුමාරියි. මන්තුකාරිගෙ දුවයි හාහක් සතුටෙන් සිර කුටියෙන් එළියට ආවා...
මන්න කුමාරි නිදහස් වුනා කියල ඉක්මනට කුමාරයව බලන්න යන්න හදිස්සි කරන්න වුනා..
එයා එහෙම කිව්වට මම කොහොමද මගෙ කුමාරයව නොදැක ඉන්නෙ... බැ.. බැ.. ඒකනම් කොහොමවත් කරන්න බැහැ...
මොනව උනත් කුමාරිට නම් කුමාරයව ගැන අමතක කරන්න කොහොමවත් බැහැ.. එයා හැමවයි කල්පනාව ආයෙත් සැරයක් කුමාරයව බලන්න යන්න ඕනමයි කියල සිතාගත්තා....

අවසාන කොටස

*පාළුකරයේ දින හතළිහක් ගත කළ කතාව...*

සැකසුම : තිළිණ අලහකෝන්

# පරීක්ෂා 3 ක්

